

පාකෙන්හම් දුම්රිය ස්ථානයේ ඉදිකිරීම් සිදුවෙමින් පවතී

SINHALESE

පාකෙන්හම්, 2023 දෙසැම්බර්

# දුම්රිය හරහා දිවෙන පාර ඉවත් කිරීම ප්‍රජාව සඳහා යාවත්කාලීන

LEVEL CROSSING REMOVAL PROJECT

## 2023 වසර සම්බන්ධ සම්පිණ්ඩනය

**අප පාකෙන්හම් දුම්රිය හරහා දිවෙන පාර ඉවත් කිරීමේ කටයුතු අවසන් කිරීමට ආසන්නයේ සිටින අතර ඔබගේ ඉවසීම සම්බන්ධයෙන් අපි ඔබට ස්තුතිවන්ත වෙමු**

පාකෙන්හම්හි මැක්ග්‍රෙගර් රෝඩ්, මේන් ස්ට්‍රීට් සහ රේස්කෝර්ස් රෝඩ් හි ඇති භයානක සහ ජනාකීර්ණ දුම්රිය හරහා දිවෙන පාරවල් ඉවත් කිරීම සහ පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම්හි නව දුම්රිය ස්ථාන ගොඩනගමින් තිබෙන අතර 2023 වසරේදී අප සැහෙන දුරට කටයුතු සිදු කර ඇත.

වසර ඉතා වැදගත් සන්ධිස්ථානයක් පසු කරමින් අවසන් වී ඇත - කණ්ඩායම විසින් දුම්රිය පාලම් දෙකට අවශ්‍ය අවසාන එල්-බීම් ස්ථාපනය කර ඇත. 2024 අවසන් වන විට මෙම පාලම් දෙක ඔස්සේ දුම්රිය හරහා දිවෙන පාරවලින් තොරව පාකෙන්හම් ඔස්සේ දුම්රිය දිවෙනු ඇත.

දුම්රිය ස්ථානයේ දකුණු පස ප්‍රථම කැනපි ස්ථාපනය කිරීම මගින් පාකෙන්හම් දුම්රිය ස්ථානය හට යම් ආවරණයක් ලැබී ඇත. පදික වේදිකා සඳහා අත්තිවාරම් දැමීම, සෝපාන ෂාෆ්ටයන් ස්ථාපනය කිරීම සහ රථගාල සඳහා තාර දැමීම මගින් ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානයේද වැඩ කටයුතු සිදුවෙමින් පවතී.

මෙල්බර්න්හි ඉතාම අවිවේකී දුම්රිය මාර්ගය වඩා විශ්වාසනීය කරමින් සහ පොදු ප්‍රවාහනය සහ නගර මධ්‍යස්ථානයට වඩා හොඳ සම්බන්ධතාවයන් ලබා දෙමින් දුම්රිය හරහා දිවෙන පාරවල් තුනම ඉවත් වන අතර නව නූතන දුම්රිය ස්ථාන දෙකක් 2024 දී විවෘත වනු ඇත.

### මෙම දුම්රිය හරහා දිවෙන පාරවල් ඉවත් විය යුතු හේතුව

සතියේ සෑම දිනකම මෙම දුම්රිය හරහා දිවෙන පාරවල් ඔස්සේ **රථවාහන 63,000 ක්** ගමන් කරයි

උදෑසන කලබලකාරී වේලාවලදී **මිනිත්තු 30 කට** වඩා වේලාවක් බූම් ගේට්ටු වසා තබයි

දිනපතා දුම්රිය හරහා දිවෙන පාරවල් ඔස්සේ මෙට්රො දුම්රිය සහ **වී/ලයින් දුම්රිය 170 ක්** එහා මෙහා ගමන් කරයි

දිනපතා ක්‍රේන්බර්න් - පාකෙන්හම් මාර්ගය **මගීන් 90,000 ක්** විසින් භාවිතා කරයි

යාවත්කාලීන සඳහා අනුසන් කරන්න
levelcrossings.vic.gov.au

VICTORIA'S BIG BUILD

# බීම් සිහින කණ්ඩායම

## කිමී 2.5 ක් දිග ඔසවන ලද දුම්රිය පාළම ස්ථානගත කිරීම සඳහා 2023 වසරේදී එල්-බීම් 272 ම ඔසවන හේතුවෙන් අපි කාර්ය බහුලව සිටියෙමු.

අප්‍රියෙල් මාසයේ මැක්ග්‍රෙගර් රෝඩ් සහ මේන් ස්ට්‍රීට් හිද, ඔක්තෝබර් මාසයේ රේස්කෝර්ස් හිද බීම්ස් ස්ථාපනය කිරීම හේතුවෙන් මෙම වසරේදී අපගේ කණ්ඩායම ප්‍රධාන සන්ධිස්ථානයක් පසු කරන ලදී.

සෑම බීමයක්ම වික්ටෝරියා ප්‍රාන්තයේ ගොඩනැගූ අතර දිගින් මීටර් 25 සිට 32 ක්ද බරින් ටොන් 135 දක්වාදවේ.

දුම්රිය පාළම ස්ථාපනය කර ඇති බැවින් කණ්ඩායම විසින් සිල්පර කොටන් 6500 ක් ස්ථාපනය කිරීමද, පාළම සඳහා අවශ්‍ය කිමී 7.8 ක්වූ නව දුම්රිය මාර්ගද, පළාතේ ගල්වලවලින් ලබාගත් බැලස්ට් ටොන් 18,000 ක් ඇතිරීමද සිදු කරනු ඇත.

## McGregor Road




*2023 ආරම්භය*



*2023 අවසානය*

## Racecourse Road



*2023 ආරම්භය*




*2023 අවසානය*

## Main Street



*2023 ආරම්භය*



*2023 අවසානය*




පාකෙන්හම් දුම්රිය ස්ථානය 2023 අවසානය

# පාකෙන්හම් විශාල ලෙස ගොඩ නැගීම

2023 වසරේදී නව පාකෙන්හම් දුම්රිය ස්ථානය බිම් මට්ටමේ සිට ගොඩ නැගී ඇත. අපගේ කණ්ඩායම විසින් වසර ආරම්භ කලේ දුම්රිය ස්ථානය සඳහා අත්තිවාරම් පයිල් කිරීම සහ යටිබිම් සේවා ස්ථාපනය කිරීම මගින්ය.

නව සුපිරි දුම්රිය ස්ථානයට අවශ්‍ය රාමුව සැකසීම සඳහා විශාල කොන්ක්‍රීට් ස්ලැබයක් දමන ලදී. මෙයට දුම්රියට නැගීම සඳහා මගීන් පදික වේදිකාව වෙත ගෙන යන ලිෆ්ට් ෂාෆ්ටයන් සහ තරප්පු ස්ථාපනය කිරීමද ඇතුලත්ය.

දුම්රිය ස්ථානයේ දකුණු පස, වානේ කණු 14 ක් - හෝ කැනපි කොළම් - ස්ථාපනය කිරීමද සිදු කරන ලදී. මෙම මීටර් 15 ක් උස කණු මගින් ස්කයිලයිට් 14 ක් ඇතුළු දුම්රිය ස්ථානයේ වහලේ ව්‍යුහාත්මක වානේවලට ශක්තිය ලබාදෙයි.

කණ්ඩායම මගින් පාකෙන්හම් හි රෝලිං හිල්ස් සහ බ්‍රොන්ස් සන්සෙට් මගින් ආභාෂය ලත් බ්‍රෙන්ස්ඩ් වහලක් සෑදීම සඳහා අවශ්‍ය පළමුවන බීම් 258 ස්ථාපනය කිරීම ආරම්භ කරන ලදී.



පාකෙන්හම් දුම්රිය ස්ථානය, 2023 ආරම්භය



*ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානය, 2023 අවසානය*

# ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානය

## කණ්ඩායම මගින් මෙම වසරේදී ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානයේ සැලකිය යුතු ප්‍රගතියක් ඇති කරන ලදී.

නව දුම්රිය ස්ථානයේ සහ යටින් දිවෙන මාර්ගයේ වැඩ කටයුතු සිදුවන අතර ඇතිවන බාධාවන් අවම කිරීම සඳහා ඔවුන් විසින් නව දුම්රිය මාර්ග ගොඩනගන ලදී. ජූනි මාසයේ දුම්රිය වෙනුවට බස්රථ ගමන ආරම්භ කල විට, නව දුම්රිය මාර්ග රේස්කෝර්ස් රෝඩ්හි දැනට ඇති දුම්රිය මාර්ගය සමඟ සම්බන්ධ කරන ලදී. මේ මගින් නව දුම්රිය ස්ථානයේ දකුණු පස ගොඩනැගීම ආරම්භ කිරීමට අපට උපකාර විය.

හැරීම් සහ කැණීම් සම්පූර්ණවීම හේතුවෙන්, යටින් දිවෙන මාර්ගය සහ දුම්රිය පදික වේදිකාව සම්බන්ධ කෙරෙන සුපර් ටී ලෙස හැඳින්වෙන විශාල කොන්ක්‍රීට් බීම් හයක් ස්ථාපනය කරන ලදී. පදික වේදිකාවට ප්‍රවේශවීම සඳහා ලිෆ්ට් ෂාෆ්ටයන් සහ තරප්පුද ස්ථාපනය කරන ලදී.

දුම්රිය ස්ථානය සහ යටින් දිවෙන මාර්ගයට පරිබාහිරව කාර්ය මණ්ඩල ගොඩනැගිලි සම්පූර්ණ වීමට ආසන්න අතර, වාහන රථගාලට තාර දමා ඇති අතර 2024 වසරේදී මගීන් හට මෙය සූදානම්ය.

## ව්‍යාපෘති කාලවකවානු

**2019**

- ස්ථාන ගවේශණය
- තාක්ෂණික සහ ඉංජිනේරු ඇගයීම
- ප්‍රජා සහභාගිත්වය

**2021 මුල් භාගය**

- ප්‍රජා සහභාගිත්වය
- වැඩිදුර ඉංජිංනේරු සහභාගිත්වය

**2021 මැද භාගය**

- දුම්රිය ස්ථාන සැලසුම් නිවේදනය කිරීම

**2021 අග භාගය**

- විවෘත අවකාශ සම්බන්ධ ප්‍රජා සහභාගිත්වය
- කල්තියා කරන වැඩ කටයුතු

**2022**

- ඉදිකිරීම
- විවෘත අවකාශ සැලසුම නිකුත් කිරීම

**2023**

- ඉදිකිරීම

**2024**

- වැඩි යහපතට බූම් ගේට්ටු ඉවත්වීම
- පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථාන විවෘත කිරීම
- ප්‍රජා අවකාශ විවෘත කිරීම

**කාලවකවානු වෙනස්වීම්වලට යටත්වේ*

# ජනවාරි මාසයේදී කුමක් සිදුවේද?

දෙසැම්බර් 22 වන සිකුරාදා අපගේ වැඩබිම්වල වැඩ කටයුතු නවත්වන අතර ජනවාරි 10 වන බදාදා නැවත ආරම්භවේ.

**ජනවාරි මාසයේ ව්‍යාපෘති කණ්ඩායම:**

- මේන් ස්ට්‍රීට් සිට රේස්කෝර්ස් රෝඩ් දක්වා පාළමේ දුම්රිය මාර්ගය, සිල්පර කොටන් සහ බැලස්ට් ස්ථාපනය කිරීම දිගටම සිදු කරයි
- පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථාන ගොඩනැගිලිවල ඇතුලත වැඩ කටයුතු සිදු කරයි
- රයන් රෝඩ්හි වැඩි දියුණු කිරීමේ කටයුතු කෙරෙහි අවධානය යොමු කරයි.

**බලාපොරොත්තු විය හැකි දේ**

- ගොඩනැගීම් කරන වාහන සහ යන්ත්‍රෝපකරණ එහා මෙහා ගෙන යාම
- වැඩිපුර ශබ්දය, ධූවිලි සහ දෙදරීම්
- සමහර අවස්ථාවල අමතර විදුලි ආලෝකය
- රථවාහන කළමණාකරණය සහ මාර්ග වෙනස් කරන සංඥා පුවරු
- වැඩ කටයුතු කරන සාමාන්‍ය වේලාවන් සඳුදා සිට සිකුරාදා දක්වා පෙව 7 සිට පව 6 දක්වා සහ සෙනසුරාදා දිනවල පෙව 7 සිට පව 3 දක්වා

**පාකෙන්හම් රෝඩ්හි වැඩිදියුණු කිරීමට අදාල බාධා සිදුවීම්**

- **2024 ජනවාරි 3 වන බදාදා පව 7 සහ ජනවාරි 25 වන බ්‍රහස්පතින්දා පව 7** අතර ෆ්‍රීවේ ඇතුලට පැමිණෙන ඉවත්ව යන සහ ඇතුලට පිවිසෙන රැම්ප් ඇතුළුව, සවුත්ඊස්ට් බුලවාර්ඩ් සහ ප්‍රින්සස් ෆ්‍රීවේ අතර හේල්ස්විල්-කූ වී රජ් රෝඩ් වසා තබනු ඇත.
- **ජනවාරි 29 වන සඳුදා පව 7 සිට මාර්තු 4 වන සඳුදා පෙව 5** අතර සහ සවුත්බවුන්ඩ් වටරවුම සහ හෙන්රි රෝඩ්/වෙබ්ස්ටර් වේ මංසන්ධිය අතර මැක්ග්‍රෙගර් රෝඩ් සහ ෆ්‍රීවේ පිටතට යන ඉවත්ව යන රැම්ප් එක වසා තබනු ඇත.

**levelcrossings.vic.gov.au**

contact@levelcrossings.vic.gov.au

ඉංග්‍රීසි හැර වෙනත් භාෂා සඳහා, කරුණාකර දුරකථන අංක 9209 0147 අමතන්න.

1800 105 105 (ඕනෑම අවස්ථාවක අමතන්න)

මෙම තොරතුරු ප්‍රවේශවිය හැකි ආකාරයකට ලබා ගැනීම සඳහා අප හා සම්බන්ධ වන්න. ඔබට ශ්‍රව්‍ය ආබාධයක් ඇති නිසා උපකාර අවශ්‍ය නම් කරුණාකර **relayservice.gov.au** වෙත පිවිසෙන්න.

NWP10215